AL/2022(2023)/57/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022 (2023)

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

විභාග අංකය : ..................................

| I කොටස | |
|---|---|
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

* I කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* II කොටස – A හා B කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

● නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**1.** "නාට්‍යය යනු ලෝකයාගේ පැවැත්ම අනුකරණය කිරීමකි." මෙය කවරකු ගේ නිර්වචනයක් ද?
(1) භරතමුනි (2) ධනංජය (3) අභිනවගුප්ත
(4) භට්ටලෝල්ලට (5) භට්ටනාරායණ (.........)

**2.** 'නෘත්‍ය' යන්නට වඩාත් ගැළපෙන වරණය තෝරන්න.
(1) නෘත්‍යයෙහි ඇත්තේ අර්ථ විරහිත රිද්මයකි.
(2) නෘත්‍ය යනු රිද්මයානුකූල අංග චලනය යි.
(3) උඩරට නර්තනයෙහි නෘත්‍ය බහුල වශයෙන් අන්තර්ගත ය.
(4) නෘත්‍ය යනු නෘත්ත යන්නට පර්යාය පදයකි.
(5) ආංගික සහ සාත්ත්වික අභිනය මගින් කිසියම් භාවයක් ප්‍රකට වන නර්තනයකි. (.........)

**3.** සාත්ත්වික අභිනය පමණක් අඩංගු වරණය තෝරන්න.
(1) අශ්‍රු, ප්‍රලය, ස්තම්භ, ස්වරභංග, වේපථු
(2) හස්ත, අපවාරිත, වේපථු, රෝමාංච, ජඩතා
(3) වෛවර්ණ්‍ය, ප්‍රලය, ස්වේද රෝමාංච, ග්ලානි
(4) වේපථු, චාරී, ගද්ගද, ප්‍රලය, ස්වේද
(5) ප්‍රලය, චාරී, ග්ලානි, ජඩතා, අපවාරිත (.........)

**4.** ආහාර්ය අභිනය පිළිබඳ නිවැරදි වරණය තෝරන්න.
(1) අංග රචනය ආහාර්ය අභිනයට අයත් නො වේ.
(2) ආහාර්ය අභිනය වැදගත් වන්නේ නාට්‍යධර්මී ශෛලියේ දී ය.
(3) ආහාර්ය අභිනය නළු නිළියන් හඳුනාගැනීමට උපකාරී වේ.
(4) නාට්‍යයේ ශෛලිය ආහාර්ය අභිනයට අදාළ නො වේ.
(5) චතුර් අභිනයෙන් අවම වශයෙන් වැදගත් වන්නේ ආහාර්ය අභිනය යි. (.........)

**5.** 'ආලවක දමනය' නම් බෞද්ධ පූජා කර්මයෙහි අන්තර්ගත චරිතය කුමක් ද?
(1) දේව දූතයා (2) ගදභ (3) මිලිඳු රජු
(4) දේශනාවාදීහු (5) බහුබූතයා (.........)

**6.** කොහොඹා කංකාරියේ එන ඌරා යක්කමේ ඌරෙකුගේ වේශයක් ගෙන සිටින්නේ කවරෙක් ද?
(1) මලය රජ (2) රාහු අසුරේන්ද්‍රයා (3) සඳහිරු
(4) විජය රජ (5) කිත්සිරු (.........)

[දෙවැනි පිටුව බලන්න.

7. සැන්දෑ පිදේනිය හා උඩුවියන් පාලිය අන්තර්ගත වන්නේ කවර ශාන්තිකර්මයේ ද?
(1) රට යකුම (2) සන්නියකුම (3) සූනියම් යාගය
(4) මංගර මඩුව (5) කොහොඹා කංකාරිය (.........)

8. කෝලම් නාටකවල මරු රාක්ෂසයා ගේ වර්ණනාවට සමාන කවි ඇති ශාන්ති කර්මය කුමක් ද?
(1) රට යකුම (2) සූනියම් යාගය (3) සන්නි යකුම
(4) ගම්මඩුව (5) දෙවොල් මඩුව (.........)

9. කාරිය කරවන රාළ ගායනා කරන පහත සඳහන් කවියෙන් පසු සබයට එන්නේ කුමන කෝලම් චරිතය ද?
"පණිවිඩ කරවනා - ලෙසට සබයට එමිනා
බස්තමක් රැගෙනා - එන්ට සැරසී සබයෙ සිටිනා"
(1) හේවායා (2) ආරච්චි (3) පොලිස් (4) මුදලි (5) අඩබෙර (.........)

10. ශ්‍රී ලාංකේය වේදිකා නාට්‍ය ඉතිහාසයේ ප්‍රථම වතාවට රංගනය සඳහා ස්ත්‍රීන් සහභාගී වූ නාට්‍ය ප්‍රභේදය කුමක් ද?
(1) සොකරි (2) කෝළම් (3) නාඩගම් (4) කවි නාඩගම් (5) නූර්ති (.........)

11. නාඩගමෙහි අනාගතවක්තෘ ලෙසින් නම් කරනු ලබන්නේ,
(1) බහුබූත කෝළමා ය. (2) දේශනාවාදීහු ය. (3) සෙල්ලන් ළමා ය.
(4) පොතේ ගුරු ය. (5) ගුරුන්නාන්සේ ය. (.........)

12. පණ්ඩුකාභය සහ දුටුගැමුණු නූර්ති නිර්මාණය කළ රචකයා කවුද?
(1) ජෝන් ද සිල්වා (2) සී දොන් බස්තියන් (3) චාල්ස් ඩයස්
(4) මැන්දිස් පෙරේරා (5) ඩී. එල්. ස්ටීවන් සිල්වා (.........)

13. මිනර්වා නාට්‍ය පිළිබඳ නිවැරදි වරණය තෝරන්න.
(1) මිනර්වා නාට්‍ය නිර්මාණවලට ජාතක කතා පදනම් විය.
(2) නාඩගම් තනු නිර්මාණය හා සමාන නාට්‍ය ගීත මිනර්වා නාට්‍යවලට අඩංගු විය.
(3) මධ්‍යම පාන්තික ජීවන රටාව විවරණය වන කතා පුවත් මිනර්වා නාට්‍යවලට ප්‍රස්තුත විය.
(4) ගාබ්‍රියෙල් ප්‍රනාන්දු මිනර්වා නාට්‍ය රචකයෙකි.
(5) ග්‍රේටා ජෙනට් සිල්වා හා ජෙමිනි කාන්තා මිනර්වා නාට්‍යවල රඟපෑවේ නැත. (.........)

14. නාඩගමෙහි ප්‍රභවය පිළිබඳ වඩාත් නිවැරදි මතවාදය අඩංගු වරණය කුමක් ද?
(1) දකුණු ඉන්දියාවේ තෙරුක්කූත්තු ගැමි නාටකය ඇසුරෙන් නිර්මාණය වී ඇත.
(2) සංස්කෘත නාට්‍යයේ ආභාසයෙන් ප්‍රභවය වී ඇත.
(3) යුරෝපීය ජනවන්දනා නාට්‍ය ආශ්‍රයෙන් ප්‍රභවය වී ඇත.
(4) සොකරි, කෝළම් ආදී ගැමි නාට්‍ය ආභාසයෙන් ප්‍රභවය වී ඇත.
(5) කිසිදු විදේශ ආභාසයකින් තොර ව දේශීය ව ප්‍රභවය වී ඇත. (.........)

15. සිරිසේන විමලවීර විසින් නිෂ්පාදනය කරන ලද ටීටර් නාට්‍ය සඳහා සංගීත අධ්‍යක්ෂණය කළේ කවුද?
(1) විශ්වනාත් ලෞජි (2) සදා සිවන් (3) නවාබ් ඛාන්
(4) මෝහන් ලාල් (5) මොහමඩ් ගෞස් (.........)

16. ඇන්ටන් චෙකොව්ගේ අනුවර්තන සිංහල නාට්‍ය ඇතුළත් වරණය කුමක් ද?
(1) ඉබේ වෙදා, හැංගි හොරා, මුදලාලිගේ පෙරළිය
(2) දුටුගැමුණු, නගරයෙන් කෙතට, මායාවතී
(3) රහස් කොමසාරිස්, බහින කලාව, වෙද හටන
(4) වලහා, මඟුල් ප්‍රස්තාව, මැනේජර්
(5) පබාවතී, මනමේ, සුනේත්‍රා (.........)

17. ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය වේදිකාගත කිරීමේ දී ජීවමාන නළු-නිළියන් ගේ රංගන දායකත්වය ලබා ගත්තේ පහත සඳහන් කුමන අවස්ථාව් දක්වා ද?
(1) පිලාත් ගේ නඩු තීන්දුව දක්වා
(2) අවසාන රාත්‍රි භෝජනය දක්වා
(3) ජේසුතුමා ගල් කණුවේ බැඳ කස පහර දීම දක්වා
(4) කුරුසියේ ඇණ ගැසීම දක්වා
(5) ගල්ලෙනේ තැන්පත් කිරීම දක්වා (.........)

**18.** ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය කලාව සම්බන්ධයෙන් වැදගත් වන 'දුක්ප්‍රාප්ති ප්‍රසංගය' නම් ගද්‍ය කාව්‍ය රචනා කළේ කවරෙක් ද?
(1) ක්ලෙමන්ට් ප්‍රනාන්දු (2) ජාකොමෙ ගොන්සාල්වේස් (3) මෙරිල් ප්‍රනාන්දු
(4) ලෙස්ලි බොතේජු (5) ලෝරන්ස් පෙරේරා (.........)

**19.** දීපාවලී උත්සවයේ දී නිරූපණය වන නාට්‍යමය අවස්ථාව කුමක් ද?
(1) ගවයකු වෙනුවෙන් පවත්වන පුද පූජා
(2) නරකාසුරන් සහ විෂ්ණු අතර සටන
(3) ස්කන්ද කුමාර හා සූරන් අතර සටන
(4) පංච පාණ්ඩවයන් ද්‍රෞපදිය හා වනවාසී වීම
(5) වට්ටෙයි තිරුවිලා නම් වූ දඩයම් අවස්ථාව නිරූපණය (.........)

**20.** 'කන්නගි කුත්තු' නම් දෙමළ ජන නාටක ලංකාවේ කවර කලාපයක ව්‍යාප්ත වී පවතින්නක් ද?
(1) මඩකලපුව (2) යාපනය (3) මන්නාරම (4) වන්නි (5) උඩරට (.........)

**21.** කෘෂිකාර්මික ජන ජීවිතය හා සම්බන්ධ දෙමළ ජන නාටක විශේෂය කුමක් ද?
(1) වඩමෝඩි (2) තෙන්මෝඩි (3) මකිඩි
(4) කාත්තවරායන් කුත්තු (5) වසන්තන් කුත්තු (.........)

**22.** නාටක අරංකන් කල්ලූරි නම් නාට්‍ය ආයතනය පිහිටුවීමට මූලික ව කටයුතු කෙළේ,
(1) කේ. සිවතම්බි ය. (2) එස්. මෞනගුරු ය. (3) චෞර්ණලිංගම් ය.
(4) එස්. විද්‍යානන්දන් ය. (5) එම්. ෂන්මුගලිංගම් ය. (.........)

**23.** දේවදාසී ලෙසින් ගෘහිණියත් දේවදාසයකු ලෙස ගෘහපතියාත් මූලිකත්වය ගෙන කටයුතු කරන දෙමළ ආගමික උත්සවය කුමක් ද?
(1) තෛපොංගල් (2) හින්දු අලුත් අවුරුද්ද (3) මාටු පොංගල්
(4) මහා ශිව රාත්‍රි (5) නවරාත්‍රි මංගල්‍යය (.........)

**24.** සංස්කෘත නාට්‍යවල වේදිකාව මත එක් චරිතයක් තවත් එක් චරිතයකට පමණක් ඇසෙන සේ කතා කිරීම කවර භාෂණයක් වේද?
(1) ප්‍රකාශ (2) අපවාරිත (3) ස්වගත (4) ජනාන්තික (5) ආකාශභාෂිත (.........)

**25.** මධ්‍යම පාන්තික හා පහත් පවුල්වල සිදුවිය හැකි කතා පුවත් අන්තර්ගත සංස්කෘත නාට්‍ය ප්‍රභේදය කුමක් ද?
(1) නාටක (2) ප්‍රකරණ (3) ඩිම (4) සමවකාර (5) ප්‍රහසන (.........)

**26.** ස්වප්නවාසවදත්ත නාටකයෙහි මුඛ්‍ය රසය වන්නේ,
(1) ශෘංගාර රසය යි. (2) හාස්‍ය රසය යි. (3) කරුණ රසය යි.
(4) රෞද්‍ර රසය යි. (5) වීර රසය යි. (.........)

- පහත සඳහන් මාතෘකා අධ්‍යයනය කොට අංක **27** සිට **31** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | භාණ | F | ස්වප්නවාසවදත්ත | K | ඊහාමෘග |
| B | චාරුදත්ත | G | ප්‍රියදර්ශිකා | L | ශකාර |
| C | පංචරාත්‍ර | H | ව්‍යායෝග | M | ඌරුභංග |
| D | රත්නාවලී | I | වසන්තසේනා | N | නාගානන්ද |
| E | ප්‍රතිඥායෞගන්ධරායණ | J | දූතඝටෝත්කච | O | අවිමාරක |

**27.** රූපක ප්‍රභේද තුන කුමක් ද?
(1) A, I, O (2) A, H, K (3) B, F, K (4) C, F, L (5) C, H, L (.........)

**28.** 'මහාභාරතය' නම් කෘතිය පදනම් කරගත් නාට්‍ය තුන කුමක් ද?
(1) B, G, M (2) C, J, O (3) C, J, M (4) D, I, M (5) E, H, M (.........)

**29.** බෘහත්කතාව ආශ්‍රයෙන් රචිත නාට්‍ය තුන කුමක් ද?
(1) A, F, L (2) B, I, O (3) C, F, K (4) C, J, M (5) E, F, O (.........)


**30.** ශ්‍රී හර්ෂ විසින් රචිත නාට්‍ය තුන කුමක් ද?
(1) B, G, N (2) C, E, O (3) D, I, L (4) D, G, N (5) E, G, N (.........)

**31.** මෘච්ඡකටික නාට්‍යයේ ප්‍රධාන චරිත තුන කුමක් ද?
(1) B, I, L (2) B, F, G (3) D, I, L (4) F, G, I (5) G, I, L (.........)

**32.** සංස්කෘත නාට්‍යකලාවේ දී යමෙකු කැඳවීම, ස්ථිරසාර බව, සුවඳ ආඝ්‍රාණය කිරීම ආදිය නිරූපණය පිණිස යොදාගනු ලබන හස්තය කුමක් ද?
(1) ත්‍රිපතාක (2) අංජලී (3) අරාල (4) පුෂ්පපුට (5) පද්මකෝෂ (………)

**33.** සංස්කෘත නාට්‍ය කලාවට අනුව වේදිකාවේ සිටගන්නා ඉරියව් හැඳින්වෙන පාරිභාෂික පදය කුමක් ද?
(1) චාරි (2) ගති (3) ස්ථානක (4) කරණ (5) ස්තම්භ (………)

● පහත දැක්වෙන ජපන් රඟමඬලේ ආකෘතිය මත අංක **34** සිට **38** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




**34.** A ලෙසින් නම් කර ඇති කොටස භාවිතයට ගන්නේ,
(1) වාදක මණ්ඩලයේ සිවුදෙනාට රැඳී සිටීමට ය.
(2) අට දෙනකුන් ගෙන් සමන්විත ගායක පිරිසට රැඳී සිටීමට ය.
(3) ෂිතෙට රඟපෑම සඳහා වෙන් ව තිබෙන ස්ථානය යි.
(4) බටනලා වාදකයා රැඳී සිටින ස්ථානය යි.
(5) රහස් උමං දොරටු පිහිටා ඇති ස්ථානය යි. (………)

**35.** B ලෙසින් නම් කර ඇත්තේ,
(1) ෂිතෙ බෂිර ය. (2) වකි බෂිර ය. (3) මෙත්සුකෙ බෂිර ය.
(4) ෆුඑ බෂිර ය. (5) කම්තෙය ය. (………)

**36.** C ලෙසින් නම් කර ඇත්තේ,
(1) වාදක මණ්ඩලය රැඳී සිටින ස්ථානය යි.
(2) ක්යෝගන් රංග ගත කරන ස්ථානය යි.
(3) ගායක කණ්ඩායම පිවිසෙන දොරටුව යි.
(4) ජිඋතයිෂ සඳහා පැමිණීමට පිටවීමට ඇති දොරටුව යි.
(5) කැටපත් කාමරයට පිවිසීමට ඇති තිරය යි. (………)

**37.** D ලෙසින් නම් කර ඇත්තේ,
(1) මචරි බූතයි ය. (2) අගෙමකු ය. (3) හනමිචිය ය.
(4) හෂිගකරි ය. (5) සෙරි ය. (………)

**38.** E ලෙසින් නම් කර ඇත්තේ,
(1) කකිවරි ය. (2) අගෙමකු ය. (3) කගමිඉත ය.
(4) අතොස ය. (5) ෂිරසු ය. (………)

**39.** කබුකි නාට්‍ය සඳහා භාවිත වන කුමදොරි නම් අංග රචනා විලාස සංඛ්‍යාව නිවැරදි ව අඩංගු වරණය කුමක් ද?
(1) 85 (2) 112 (3) 115 (4) 122 (5) 126 (………)

**40.** කබුකි නාට්‍ය කලාවේ ජිදයිමොනො ලෙසින් හඳුන්වන්නේ,
(1) වෙළෙඳුන් ගේ හා ගේෂාවන් ගේ චරිත පාදක කරගත් නාට්‍ය වේ.
(2) සූදුකාරයන් හා මංකොල්ලකරුවන් පාදක කරගත් නාට්‍ය වේ.
(3) හුදු නැටුම් ප්‍රධාන කරගත් නාට්‍ය වේ.
(4) ඓතිහාසික කතා පුවත් ඇතුළත් නාට්‍ය වේ.
(5) පිරිමි චරිත පමණක් පාදක කරගත් නාට්‍ය වේ. (………)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

8192

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022 (2023)

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

## II කොටස

**උපදෙස්:**

※ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

## A කොටස

**1.** (i) අභිඥාන-ශාකුන්තලයේ අන්තර්ගත අංක සංඛ්‍යාව කීය ද? (ලකුණු 02 යි.)

(ii) එහි සිවුවැනි අංකයේ අන්තර්ගතය සැකෙවින් දක්වන්න. (ලකුණු 06 යි.)

(iii) එය නාටකයේ හොඳ ම අංකය ලෙස විචාරකයන් පවසන්නේ කවර හෙයින් ද? (ලකුණු 07 යි.)

**2.** (i) ලෝකධර්මී සහ නාට්‍යධර්මී යනු කුමක් දැ යි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02 යි.)

(ii) නාට්‍යධර්මී නාට්‍යයක වේදිකාව මත පරිසරය නිර්මාණය කරන ආකාරය අභිඥානශාකුන්තලයෙන් නිදසුන් දෙමින් විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(iii) නාට්‍යධර්මී නාට්‍යයක රඟපෑම සඳහා රූපණ ශිල්පියෙකු තම කුශලතා ප්‍රගුණ කළ යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 07 යි.)

**3.** (i) කුවේණි නාට්‍යයේ ගායක කණ්ඩායමෙන් සිදුවන කාර්යභාරයන් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(ii) කුවේණිය සංවේදී ගැහැණියක ලෙස ප්‍රේක්ෂකයාට හඳුන්වාදීමට නාට්‍යකරු කවර නාට්‍යමය උපක්‍රම භාවිත කළේ දැ යි විමසන්න. (ලකුණු 05 යි.)

(iii) පෙරදිග ගැහැණියක ගේ චරිත ස්වභාවයන් කුවේණි චරිතය ඇසුරින් ඉස්මතු කරලීමට නාට්‍යකරු උත්සාහ කොට ඇති දැ යි සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි.)

## B කොටස

**4.** (i) කබුකි නාට්‍ය සඳහා භාවිත කෙරෙන සංගීත ක්‍රම **හතර** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) කබුකි රංග ශෛලියේ ප්‍රධාන ලක්ෂණ **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි.)

(iii) කබුකි නාට්‍යයේ ප්‍රේක්ෂාව ජනනය සඳහා භාවිත රංගෝපක්‍රම විස්තර කරන්න. (ලකුණු 07 යි.)

**5.** (i) නූර්ති සංගීතඥයින් **හතර** දෙනකු නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ජෝන් ද සිල්වා සූරීන් සිංහල නාට්‍ය කලාවේ ප්‍රවර්ධනයට දැක්වූ දායකත්වය විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iii) නාඩගම් අභිබවා නූර්තිය ජනප්‍රිය වීමට බල පෑ සාධක පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

**6.** (i) රට යකුම යාගය පැවැත්වීමේ ප්‍රධාන අරමුණු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(ii) රට යකුමේ නාට්‍යමය අවස්ථා පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iii) රට යකුම සඳහා උපයෝගී කරගන්නා නාට්‍යෝපකරණ විස්තර කරන්න. (ලකුණු 06 යි.)

※ ※ ※